ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 1 වන මට්ටම 2007/2008
අවසාන පරීක්ෂණය - 2008
ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසය : SSF 1301

කාලය : පැය තුනයි (03)

දිනය :2008.09.27 වේලාව : ප.ව. 9.30 - ප.ව. 12.30

එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක් වත් තෝරාගෙන ප්‍රශ්න (5) පහකට පමණක් පිළිතුරු සපයන්න.

<u>පළමුවන කොටස</u>

(1) (i) යුරෝපයේ පුනරුදයට බලපෑ සාධක 4ක් නම් කරන්න. (ලකුණු 04)

(ii) 16 වන සියවසේදී යුරෝපයේ බිහිවූ ආගමික නායකයින් දෙදෙනෙක් හා විද්‍යාඥයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පුනරුදය නිසා ඇති වූ ප්‍රතිඵල පැහැදිලි කරන්න. (ලකුණු 12)

(2) (i) පෘතුගීසීන් පෙරදිගට පැමිණීමට හේතු වූ කරුණු මොනවාද? (ලකුණු 06)

(ii) පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන තත්ත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් පාලනය නිසා ඇති වූ සාමාජීය හා සංස්කෘතික බලපෑම් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(3) (i) 17 වන හා 18 වන සියවස්වලදී කන්ද උඩරට රාජධානියේ පැවති සමාජීය හා ආර්ථික තත්ත්වය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) කන්ද උඩරට රාජධානියේ අවුල් සහගත දේශපාලන තත්ත්වය, 1815 බ්‍රිතාන්‍යයන්ට එම රාජධානිය අපහසුතාවයකින් තොරව අත්පත් කර ගැනීමට හේතු විය."සාකච්ඡා කරන්න. (ලකුණු 10)

<u>දෙවන කොටස</u>

(4) 1818 කැරැල්ල ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) කැරැල්ලට හේතු (ලකුණු 05)

(ii) බ්‍රිතාන්‍ය රජය මගින් කැරැල්ල මැඩ පැවැත්වූ ආකාරය (ලකුණු 05)

(iii) කැරැල්ලේ ප්‍රතිඵල (ලකුණු 10)

(5) (i) 1833 කෝල්බෘක් - කැමරන් ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 08)

(ii) කෝල්බෘක් යෝජනා 1848 කැරැල්ල පැන නැගීමට බලපෑ අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 12)

UNIVERSITY OF COLOMBO LIBRARY

(6) (i) ලන්දේසීන් විසින් ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික හා වෙළඳ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ලන්දේසි හා උඩරට පාලකයින් අතර පැවති සම්බන්ධතා පැහැදිලි කරන්න (ලකුණු 10)

<u>තුන්වන කොටස</u>

(7) (i) ශ්‍රී ලංකා වතු ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාවේ වතු කෘෂිකර්මාන්තයේ වර්ධනය නිසා ඇති වූ සමාජ - ආර්ථික බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 12)

(8) (i) ශ්‍රී ලංකාවේ මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීමට බලපෑ ප්‍රධාන සාධක කවරේද? (ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රවාහනය දියුණු වීමෙන් ඇති වූ ආර්ථික ප්‍රතිඵල පැහැදිලි කරන්න. (ලකුණු 12)

(9) පහත සඳහන් මාතෘකා වලින් දෙකක් (2) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ද්විත්ව පාලනය

(ii) රෝම ලන්දේසි නීතිය

(iii) 1840 මුඩුබිම් පනත

(iv) බෙන්තම් සහ උපයෝගිතා වාදය (ලකුණු 20)

***** නියමිත කාලය අවසානයි *****